# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1158 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 14/07/2024 පැය1050

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - මොරොන්තුඩුව පොලිස් වසම.

2024.07.14 වන අද දින අළුයම් කාලයේ මොරොන්තුඩුව පොලිස් වසමේ බණ්ඩාරගම කළුතර මාර්ගයේ දැල්කඩ හන්දියේදී බණ්ඩාරගම දෙස සිට කළුතර දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන බස් නැවතුමක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු ගෝනදූව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මොරොන්තුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.

2024.07.13 වන දින දහවල් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ ජයබිම හන්දියේදී අනුරාධපුරය දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ කැබ් රථයක් ඉදිරියෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුර රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රථිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - සීගිරිය පොලිස් වසම.

2024.07.14 වන දින උදෑසන කාලයේ සීගිරිය පොලිස් වසමේ දඹුල්ල හබරන ප්‍රධාන මාර්ගයේ දිගම්පතහ ප්‍රදේශයේදී දඹුල්ල දෙස සිට හබරන දෙසට ධාවනය

වූ වෑන් රථයක් ඉදිරියෙන් පැමිණි ලොරි රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ පිටුපස ගමන් ගත් තරුණයෙකු තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ පහමුනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර සීගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**